| 81 | S | II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2007 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2007 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2007

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II**
**வணிகக் கல்வியும் கணக்கீடும் II**
**Business and Accounting Studies II**

පැය තුනයි
*Three hour*

❖ පිළිතුරු ලිවීමේ දී පැහැදිලි අත් අකුරෙන් ලියන්න.

---

## I කොටස

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. (i) මිනිස් අවශ්‍යතා හා වුවමනා කෙටියෙන් පැහැදිලි කර උදාහරණ දෙකක් ලියන්න.
(ii) වෙළෙඳාමට ඉවහල් වන උපකාරක සේවා 4ක් නම් කරන්න.
(iii) තාක්ෂණ පරිසරයේ විශේෂ ගති ලක්ෂණ 2ක් ලියන්න.
(iv) ණය කාඩ් පත් (Credit Card) භාවිතයෙන් සැලසෙන වාසි 2ක් ලියන්න.
(v) ප්‍රමිතිකරණයෙන් පාරිභෝගිකයාට සැලසෙන වාසි 2ක් ලියන්න.
(vi) 1. නිෂ්පාදන ආයතනයක දැකිය හැකි තොග වර්ග 2ක් සඳහන් කරන්න.
2. ප්‍රතිසටහනක් යනු කුමක් ද?
(vii) නිෂ්පාදන ආයතනයක පාරිභෝජන ද්‍රව්‍ය පිරිවැය යනු කුමක් ද?
(viii) සුළු මුදල් අග්‍රිමය යනු කුමක් ද?
(ix) මුදල් පොතේ බැංකු තීරුවේ සටහන් වී ඇති එහෙත් බැංකු ප්‍රකාශණයේ සටහන් වී නැති ගනුදෙනු 2ක් ලියන්න.
(x) අවිනිශ්චිත ගිණුම යනු කුමක් ද?

## II කොටස A - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) "ශ්‍රී ලංකා රුපියලෙහි දේශිය හා විදේශිය අගයන් හි ස්වාධීනත්වය පවත්වා ගෙනයාම රටේ සංවර්ධනයට ඉවහල් වේ." මහ බැංකුවේ මෙම අරමුණ ඉටුකරන කාර්යයන් 4ක් ලියන්න.
(ii) මධ්‍යම තැන්පතු ක්‍රමය මගින් ඉටුකරන කාර්යයන් 4ක් ලියන්න.
(iii) ඔබ ආයෝජන මාර්ගයක් ලෙස ඉඩම් මිලදී ගැනීම සඳහා යොමු වේ නම්, ඔබගේ අවධානයට ලක්විය යුතු කරුණු 4ක් ලියන්න.
(iv) කොළඹ කොටස් වෙළෙඳ පොලේ ගනුදෙනු කළ හැකි සුරකුම්පත් 2ක් නම් කරන්න.
(v) වාණිජ බැංකුවකින් ඉටුවන කාර්යයන් 4ක් නම් කරන්න.

03. (i) සී/ස පෞද්ගලික සමාගමක් සී/ස පොදු සමාගමකින් වෙනස් වන ලක්ෂණ 4ක් නම් කරන්න.
(ii) රාජ්‍ය අංශයේ ව්‍යාපාර අසාර්ථක වීමට බලපෑ කරුණු 4ක් නම් කරන්න.
(iii) විශාල ආයතනයකට අභ්‍යන්තර වශයෙන් යොදාගත හැකි සන්නිවේදන ක්‍රම 4ක් නම් කරන්න.
(iv) නව සමාගම් පනත කුමක්ද? එම පනතට අනුව වසරක් ඇතුළත දී නැවත සිදු කළ යුත්තේ කුමක් ද?
(v) ටෙන්ඩර් ක්‍රමය වෙන්දේසි ක්‍රමයෙන් වෙනස් වන ප්‍රධානතම ලක්ෂණය කුමක් ද?

## II කොටස B - ගිණුම්කරණ අධ්‍යයනය

04. 1. පහත දැක්වෙන්නේ 2006.12.31 දිනට වත්කම්, වගකීම් ශේෂ කිහිපයකි. ඒවා පොදු ජ'නලයේ ලියා දක්වන්න.

| | |
|---|---:|
| ගොඩනැගිලි | 450,000 |
| යන්ත්‍ර සූත්‍ර | 175,000 |
| ණයහිමියෝ | 54,600 |
| මුදල් ශේෂය | 28,300 |
| ණයගැතියෝ | 34,100 |
| බැංකු අයිරාව | 22,150 |

2. 1. සුළු මුදල් පොතක් පවත්වාගෙන යාම සඳහා සුදුසු ම ක්‍රමය කුමක් ද?
2. එක්තරා ව්‍යාපාරයක 2007 මැයි මාසයේ සිදු වු සුළු වියදම් ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| මැයි | 01 | ඉදිරියට ගෙන ආ සුළු මුදල් ශේෂය අග්‍රිමය ප්‍රතිපූරණය කළා | 2,920 | | | | |
| | 05 | ගමන් වියදම් ගෙව්වා | රු. 250 | මැයි | 24 | පිරිසිදු කිරීමේ ගාස්තු | රු. 120 |
| | 08 | සංග්‍රහ ගාස්තු ගත්තා | රු. 410 | | 27 | මේසයක් ගත්තා | රු. 450 |
| | 12 | සිරිපාලට ගෙව්වා | රු. 780 | | 29 | වැටුප් අත්තිකාරම් ගෙව්වා | රු. 500 |
| | 16 | ලිපිද්‍රව්‍ය | රු. 255 | | 30 | විදුලි පණිවුඩ යැව්වා | රු. 55 |
| | 18 | මුද්දර කවර ගත්තා | රු. 110 | | 31 | අතඉතිරි සුළු මුදල් ශේෂය අග්‍රිමය ප්‍රතිපූරණය කළා. | රු.60 |
| | 21 | පිනට දුන්නා | රු. 10 | | | | |

ගමන්, ලිපිද්‍රව්‍ය, තැපල් හා විවිධ යන විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොතක ඉහත ගනුදෙනු වාර්තා කරන්න.

05. 1. පහත සඳහන් ගනුදෙනු,

ප්‍රාග්ධනය + ආදායම් + වගකීම් = වත්කම් + වියදම් යන සමීකරණයට ඇතුළත් කර පෙන්වන්න.

1. ප්‍රාග්ධනය යෙදුවා රු. 80,000
2. රු. 2,000 අත්පිට මුදලට බඩු විකිණීම.
3. ගමන් ගාස්තු ගෙව්වා රු. 1,000
4. පරිගණක යන්ත්‍රයක් මිලට ගත්තා රු. 45,000
5. රු. 4,000 කට ණයට බඩු ගැනීම.
6. අයිතිකරුගේ දියණියගේ පාසල් ගාස්තු ගෙව්වා රු. 3,000
7. ණයට භාණ්ඩ විකිණීම රු. 2,500
8. ලැබූ ගෙවල් කුලිය රු. 6,500
9. රු. 650,000 ක් වටිනා තම මෝටර් රථය ව්‍යාපාරයට යෙදුවා.
10. බැංකු පොළී ගෙව්වා රු. 1,000

2. 2007 ජුනි මාසය සඳහා "ගමන" ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු තීරුව හා බැංකුවෙන් එවන ලද ප්‍රකාශණය ද පහත දැක්වේ. මුදල් පොත සංශෝධනය කර බැංකු සැසඳුම් පතක් පිළියෙල කරන්න.

**මුදල් පොත**

| | | | | | |
|---|---|---|---|---|---|
| 6/1 | ශේෂය ඉ/ගෙ | 24,850 | 6/7 | අරවින්ද (චෙ.අ. 2002) | 4,500 |
| 6/5 | සාලිය (චෙ.අ. 0032) | 7,500 | 6/12 | චමින්ද (චෙ.අ. 2003) | 2,810 |
| 6/10 | අශෝක (චෙ.අ. 0095) | 9,100 | 6/18 | කමල් (චෙ.අ. 2004) | 9,310 |
| 6/21 | සුගත් (චෙ.අ. 0121) | 12,400 | 6/27 | සිරිනාථ (චෙ.අ. 2005) | 7,230 |
| 6/30 | දම්මි (චෙ.අ. 0192) | 5,200 | 6/30 | ශේෂය ප/ගෙ | 35,200 |
| | | 59,050 | | | 59,050 |
| 7/1 | ශේෂය ඉ/ගෙ | 35,200 | | | |

**මුදල් පොත**

| | වි ස් ත ර ය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 6/1 | ශේෂය ඉ/ගෙ | | | 24,850 |
| 6/5 | චෙක්පත (0032) | | 7,500 | 32,350 |
| 6/9 | ස්ථාවර නියෝග (ගෙවල් කුලී) | 6,000 | | 26,350 |
| 6/12 | චෙක්පත (2003) | 2,810 | | 23,540 |
| 6/13 | චෙක්පත - මැණික්ගම | | 12,500 | 36,040 |
| 6/21 | චෙක්පත (0121) | | 12,400 | 48,440 |
| 6/27 | චෙක්පත (2005) | 7,230 | | 41,210 |
| 6/30 | බැංකු ගාස්තු | 400 | | 40,810 |
| | චෙක්පොත් ගාස්තු | 700 | | 40,110 |

**සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක**

සිසිර කුමාර **විසින් සම්පාදිත යි.**